# 10 මවු පිය ගුණ වරුණ

වැල්ලේ පිපෙන බිම්මල    වාසනාවන්
ගොල්ලේ පිපෙන පන්මල    වාසනාවන්
දෙපෝදට පුන්සඳ    වාසනාවන්
ජාතිත් අපේ මවුපියො    වාසනාවන්

වැල්ල ගොරෝසු ය. රළු ය. තෙතමනය නොරඳයි. එබඳු වැල්ලේ ද බිම්මල් පිපේ. ඒවාට වැලි බිම්මල් යයි කියනු ලැබේ. පන්ගස් හැදෙන්නේ ගොල්ලේ ය. එනම් සමූහ වශයෙනි. එබඳු පන් ගොල්ලක පිපෙන මල වාසනාවේ ලකුණක් වැනි ය. දෙපෝද යනු පුන් පෝයද ය. එදට පුන්සඳ පායයි. එයින් ද සිරියාව වැඩි වී වාසනාව උදා වේ. එලෙසින් ම උපනුපන් ජාති ආදරය ද ආරක්ෂාව ද පෝෂණය ද අප වෙත ලබා දුන් මවුපියන් නැවත නැවතත් සසර දී ලැබෙන්නේ නම් එය වාසනාවකි.

අපට අපේ අම්මා තාත්තා තරම් වටිනා වස්තුවක් ලොව නැති බව මෙයින් කියැවේ. දුකේදීත් සැපේදීත් අප අත නොහැර අප සමග ම සිටිමින් අපට පිහිට වන, අප රැක ගන්නා ඉටු දෙවිවරුන් වන්නේ අපේ අම්මා තාත්තා ය. ළමා වුවත්, තරුණ වුවත්, වැඩිහිටි වුවත් අපේ අම්මාට හා තාත්තාට අප කුඩා දරුවන් ය. මෙම දහම පරිසර තත්ත්වයන් ඔස්සේ ද අපට ප්‍රකට කෙරේ.

ලොව එළිය කරන්නේ සූර්යයා ය. එපමණක් නොව ලෝකයේ ජීව ගුණය පවත්වා ගැනීමට උපකාරී වන්නේ ද සූර්යයා ය. සූර්යයා නැති කල ලෝකයක් නොපවත්නේ ය. හිරු පායන්නේ පෙරදිග හෙවත් නැගෙනහිර දිශාවෙනි. අප ලොවට ජනිත වූයේ මවුපියන් නිසා ය. ඔවුන් අපේ ලොවේ හිරු ය. අපගේ ජීවගුණය රැක දෙන්නට ඔවුහු දිවිහිමියෙන් ම ක්‍රියා කරති. එසේ වූ ලොවක දෙමවුපියන් හා දරුවන් අතර පැවතිය යුතු අසහාය බැඳීම අප හොඳින් තේරුම් ගත යුතු ය.

මෙම බැඳීම තේරුම් ගැනීම සඳහා අපට උපකාර වන වටිනා බුද්ධ දේශනාවක් සූත්‍ර පිටකයේ දක්වේ. ඒ සිගාලක සූත්‍රය හෙවත් සිගාලෝවාද සූත්‍රයයි. එය පුතෙකුට දේශනා කරන ලද්දකි. දරුවන් වන අප, අපගේ දෙමවුපියන්ට කෙසේ සත්කාර සම්මාන කළ යුතු ද යන්න සිගාලෝවාද සූත්‍ර දේශනාවේ ඇතුළත් කරුණුවලින් අවබෝධ කර ගත හැකි ය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ සිගාල අමතා පරිසරයේ ඇති දිශා හය, එකිනෙකට බැඳී සිටින සමාජ කණ්ඩායම් හයක් ලෙස පැහැදිලි කර දුන් සේක.

බුදුදහමෙහි දෙමාපියන් හඳුන්වා දීමේ දී ඔවුන්ට මහා බ්‍රහ්මයාගේ තත්ත්වය පිරිනමා ඇත්තේ ය. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සිව් බඹ විහරණයන්ගෙන් සම්පූර්ණ වන්නේ දෙමාපියන් ය. දෙමවුපියෝ මෛත්‍රී සහගත ව දරුවන් රකිති; දරුවන්ගේ යහපත උදෙසා ම ක්‍රියා කරති; දරුවන්ගේ දුක සැප දෙකේ දී අත නොහැර සිටිති. මෙත්තා හෙවත් මෛත්‍රිය යනු මිතුරු සිත ය. එනම් හද පත්ලෙන් ම අනෙකාගේ සුවසෙත කැමැති වීමයි. කරුණාව යනු අනුන්ගේ දුක ගැන කම්පා වීම ය. ඒ දෙස දයාවෙන් බැලීම ය. දුකට පිහිට වීම ය. මුදිතා යනු අනුන්ගේ සැපත, ජයග්‍රහණය දැක ඊර්ෂ්‍යා නොකිරීම ය; සතුටු වීම ය. උපේක්ෂා යනු මැදහත්කම ය; මැදහත් ව සිතා මැදහත් ව ක්‍රියා කිරීම ය. මෙකී ගුණ ධර්මයෝ දරුවන් පිළිබඳ ව මවුපියන් වෙත ද දක්නට ලැබෙත්.

දරුවාගේ දියුණුව ම වෙනුවෙන් වෙහෙසෙන ආදරණීය දෙමාපියන්ට දරුවන් විසින් ගෞරව දැක්විය යුතු ය; ඔවුන්ගේ කාර්යයන්හි දී සහාය විය යුතු ය; ආදරය කළ යුතු ය; මෛත්‍රී සහගත ව රැක ගත යුතු ය; වැඳුම් පිදුම් කළ යුතු ය. කොතෙක් උපකාර කළ ද දෙමවුපියන්ගෙන් සිදු වන සේවය වෙනුවෙන් දරුවන්ට ණය ගෙවා අවසන් කළ නොහැකි ය.

මගෙ අම්මා මට හිත කැමතියි
මගෙ අම්මා මට සැප කැමතියි
ඈ මගෙ වැඩි දියුණුව ම පතයි
සිහිනෙන් වත් අවැඩක් නො සිතයි

(භක්ති ගීත, පූජ්‍ය යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමි)



ඉහත දැක්වූ කවියෙන් මව ගැන කියවුණත් පිය සෙනෙහස ද එයට දෙවැනි නොවේ. ඒ නිසා ම අපි දෙමාපියන්ට ඉහත කී පරිදි සැලකිලි කළ යුතු වෙමු. එය මවුපිය උපස්ථානය නම් වේ.

සෑම මනුෂ්‍යයෙකුට ම දෙමවුපියන්ගෙන් ආදරය මෙන් ම ආරක්ෂාව ද පෝෂණය ද ලැබෙයි. දෙමවුපියන්ගෙන් ලැබෙන ආදරය හා සමාන ආදරයක් වෙනත් අයගෙන් ලැබෙන්නේ නැත. දරුවකුට දෙමවුපියන්ගෙන් ලැබෙන ආරක්ෂාව තරම් ආරක්ෂාවක් ද වෙනත් කෙනෙකුගෙන් අපේක්ෂා කළ නොහැකි ය. දරුවන්ගේ කුසගින්න දෙමවුපියන්ටත් දැනේ. තමන් බඩගින්නේ සිටිමින් දරුවන් පෝෂණය කරන දෙමාපියන් දරුවන්ට ආශීර්වාදයකි.

මවුපියන්ට සැලකීම බුදුරජාණන් වහන්සේ විසින් ද කරන ලද්දකි. සිගාලෝවාද සූත්‍රයට අනුව පහත සඳහන් අයුරින් අපට මවුපිය උපස්ථානය සිදු කළ හැකි ය.

1. ආහාර පාන සපයා දීම
2. අවශ්‍යතා ඉටු කර දීම
3. පරම්පරාව රැක ගැනීම
4. පරපුරෙන් පැවරී ඇති දේපළ ආරක්ෂා කිරීම
5. දෙමාපියන් මිය ගිය පසු පිංකම් කොට පිං අනුමෝදන් කිරීම

මෙසේ උපහාර ලබන්නේ දරුවන්ට කරුණු පහකින් සංග්‍රහ කරන දෙමාපියන් බව අප සිහි තබා ගත යුතු ය. එම කරුණු මෙසේ ය;

1. දරුවන් පවින් වැළැක්වීම
2. යහපතෙහි පිහිටුවීම
3. ශිල්ප ඉගැන්වීම
4. සුදුසු වයසේ දී ආවාහ විවාහ කර දීම
5. සුදුසු කල දායාද පවරා දීම

මෙසේ සංග්‍රහ ලැබීම නිසා දරුවෝ මැනැවින් යුතුකම් ඉටු කරන්නට නිතැතින් ම පෙළඹෙති. දෙමාපිය දූදරු සම්බන්ධතාව මැනැවින් සුරැකේ. මවුපියන් දරුවන්ට ආදරයෙන් සලකන්නා සේ ම දරුවන් ද දෙමාපියන්ට ආදරයෙන්, ගෞරවයෙන් සැලකිය යුතු ය.

## සාරාංශය




දෙමාපියන් දරුවන්ගේ වටිනා ම වස්තුවයි. ඔවුන් බ්‍රහ්ම නාමයෙන් හැඳින්වෙන්නේ ද එම ශ්‍රේෂ්ඨත්වය නිසා ය. සතර බඹ විහරණවලින් දෙමාපියන් යුක්ත වන නිසා බ්‍රහ්ම නාමයට ඔවුහු සුදුස්සෝ වෙති.

දෙමාපියන්ට දරුවන් උපස්ථාන කළ යුත්තේ කෙසේ දැයි සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වේ. එසේ ම දෙමාපියන් දරුවන් කෙරෙහි අනුකම්පාවෙන් ඉටු කළ යුතු කරුණු ද එහි දැක්වේ. දරුවන් දෙමාපියන්ට කරුණු පහකින් සැලකුම් කළ යුතු ය. දෙමාපියන් ද දරුවන්ට කරුණු පහකින් උපකාර කළ යුතු ය.

බුදුරජාණන් වහන්සේ ද මවුපියන් වෙනුවෙන් යුතුකම් ඉටු කළ සේක.

## ක්‍රියාකාරකම



1. දරුවන් විසින් දෙමවුපියන්ට ඉටු කළ යුතු යුතුකම් මොනවා ද?
2. දෙමවුපියන්ගෙන් දරුවන්ට සැලසෙන යහපත ලියන්න.

## පැවරුම



1. දෙමාපිය ගුණ සඳහන් වන කවි දෙකක් නිර්මාණය කරන්න.

2. දෙමවුපියන් සතුටින් තැබීම සඳහා ඔබට කළ හැකි දේවල් ලැයිස්තුගත කරන්න.

## පුහුණුවට

1. ඔබ දන්නා දෙමාපිය වන්දනා ගාථා දෙකට අමතර ව පහත සඳහන් ගාථා දෙක ද පාඩම් කර ගන්න.

(i) දසමාසමුදරේ කත්වා
පෝසේසි කරුණාය මං
මාතරං තං අහං වන්දේ
පුඤ්ඤං දත්වාන සාදරං

දස මස කුස දරා
කරුණා සිතින් මා හැදූ
මගේ මෑණියන්හට
වඳිමි අදරැති සිතින් පින් දී

(ii) පාපා මං නිවාරෙත්වා
කල්‍යාණේ මං නිවේසයී
පිතරං තං අහං වන්දේ
පුඤ්ඤං දත්වාන සාදරං

පාපයෙන් වළකා
යහපතෙහි මා යෙදූ වූ
මගේ පියාණන්හට
වඳිමි අදරැති සිතින් පින් දී

(මිය ගිය දෙමාපියන්ට ද මෙම ගාථාවලින් වන්දනා කළ හැකි ය. පින් අනුමෝදන් කළ හැකි ය.)